# 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධි පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශය

## ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ සහ යාපනය විශ්වවිද්‍යාලයීය වව්නියා මණ්ඩපයේ තොරතුරු සන්නිවේදන හා තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධි පාඨමාලාවට අපේක්ෂකයින් තෝරා ගැනීමේ පොදු යෝග්‍යතා පරීක්ෂණය

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධි පාඨමාලාව සඳහා ශිෂ්‍යයින් බඳවා ගැනීමට පොදු යෝග්‍යතා පරීක්ෂණයක් පැවැත්විය යුතුයැයි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තීරණය කර ඇත. ඒ අනුව එම පරීක්ෂණයට පෙනී සිට සමත් වන්නන් ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයට හෝ යාපනය විශ්වවිද්‍යාලයේ වව්නියා මණ්ඩපයට තෝරා ගැනීම පිණිස සලකා බලනු ලැබේ. විශ්වවිද්‍යාලයීය ප්‍රවේශය සඳහා අවශ්‍ය අවම සුදුසුකම් **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් ප්‍රකාශිත ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලාව සඳහා ප්‍රවේශය – 2020 / 2021 අධ්‍යයන වර්ෂය** අත්පොතෙහි **2.2.8.31 ඡේදයෙහි (120 පිටු)** දක්වා ඇත.

ඉහත පාඨමාලාව සඳහා ඇතුළත්වීමට අපේක්ෂා කරන්නන් විසින් 2020 / 2021 අධ්‍යයන වර්ෂයට විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයට අමතරව මෙහි දක්වා ඇති පොදු යෝග්‍යතා පරීක්ෂණයට ද අයදුම් කර පෙනී සිට ඉන් සමත් විය යුතුය.

මෙම යෝග්‍යතා පරීක්ෂණය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පහත සඳහන් විභාග මධ්‍යස්ථානවලදී පැවැත්වෙන බව කරුණාවෙන් සලකන්න.

| | |
|---|---|
| 01 | මිහින්තලය |
| 02 | වව්නියාව |
| 03 | යාපනය |
| 04 | කුරුණෑගල |
| 05 | මහනුවර |
| 06 | කොළඹ |
| 07 | බදුල්ල |
| 08 | මාතර |
| 09 | මඩකලපුව |

### යෝග්‍යතා පරීක්ෂණය සඳහා සුදුසුකම්

මෙම පාඨමාලාව සඳහා සලකා බැලීමට ඉහත සඳහන් පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිකුත් කර ඇති 2020 / 2021 ප්‍රවේශ අත්පොතෙහි 2.2.8.31 ඡේදයේ (120 පිටුව) දක්වා ඇති අමතර සුදුසුකම් අයදුම්කරුවන් විසින් සපුරා තිබිය යුතුය.

### අයදුම්පත් ඉදිරිපත් කිරීමේ පටිපාටිය

01. ඉහත දක්වා ඇති ආකෘතියට අනුව ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් තමා විසින් ම පිළියෙල කරගත් A4 ප්‍රමාණයේ ඉල්ලුම් පත්‍රයක්

    **හෝ**

    ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය http://www.rjt.ac.lk වෙබ් අඩවියෙන් හෝ යාපනය විශ්වවිද්‍යාලයීය වව්නියා මණ්ඩපයේ http://www.vau.jfn.ac.lk වෙබ් අඩවියෙන් අවපතනය (Download) කර ගත් ආදර්ශ ඉල්ලුම්පත්‍රය

    **හෝ**

    මිහින්තලේ, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ විභාග හා අධ්‍යයන අංශය වෙතින් හෝ වව්නියාව, යාපනය විශ්වවිද්‍යාලයීය වව්නියා මණ්ඩපයෙහි විභාග හා ශිෂ්‍ය සේවා අංශය වෙතින් ලබාගත් අයදුම්පතක් භාවිතා කරන මෙන් අපේක්ෂකයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. **අත් අකුරින් සකස් කළ ඉල්ලුම්පත්‍ර භාර ගනු නොලැබේ.**

02. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ අංක 008-1-001-8-1725841 දරන මහජන බැංකු ගිණුමට (අනුරාධපුර ශාඛාව) බැරවන සේ ඕනෑම මහජන බැංකු ශාඛාවකින් ලබාගත් ගෙවීම් වවුචරයක් මගින් යෝග්‍යතා පරීක්ෂණ ගාස්තුව වූ රු. 1,000/- මුදල ගෙවිය හැක. තමා වෙත ඡායාපිටපතක් තබා ගෙන මුදල් ගෙවූ කුවිතාන්සියේ අයදුම්කරු සඳහා වූ පිටපත, ඉල්ලුම් පත්‍රය සමග අමුණා එවිය යුතු වේ. **මුදල් ඇණවුම් හෝ චෙක්පත් භාරගනු නොලැබේ.**

03. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය සමග, 2020 අ.පො.ස. (උසස් පෙළ) සහතිකය, අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සහතිකය සහ ජාතික හැඳුනුම්පත (හෝ තැපැල් හැඳුනුම්පත) යන ඒවායේ සහතික කළ ඡායා පිටපත් එවිය යුතු වේ. (එම සහතිකපත් විදුහල්පති හෝ සාමදාන විනිශ්චයකාරවරයෙකු විසින් සහතික කර නිල මුද්‍රාව තැබිය යුතු වේ) සහතිකවල මුල් පිටපත් නොඑවිය යුතු බව සලකන්න.

### සැලකිය යුතුයි

01. සහතික පත්‍රවල සඳහන් නම සහ ඉල්ලුම් පත්‍රයේ සඳහන් නමෙහි කිසියම් වෙනසක් ඇතොත් එම නම් වලින් හැඳින්වෙන්නේ එකම පුද්ගලයෙකු බව සහතික කරන දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු වේ.

02. යෝග්‍යතා පරීක්ෂණ සඳහා නියමිත අයදුම් කිරීමේ අවශ්‍යතාවන් සපුරාලන අපේක්ෂකයින් වෙත පමණක් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ.

03. පහත දක්වා ඇති කරුණු වලට අදාළව ඔබගේ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප විය හැක.

    අ. අපේක්ෂකයා විසින් යෝග්‍යතා පරීක්ෂණය සඳහා අවශ්‍ය අවම සුදුසුකම් සපුරා නොතිබීම.

    ආ. අයදුම් පත්‍රය සමග, බැංකුවට මුදල් ගෙවූ කුවිතාන්සිය සහ 2020 අ.පො.ස. (උසස් පෙළ) සහතිකය, අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සහතිකය සහ ජාතික හැඳුනුම්පත හෝ තැපැල් හැඳුනුම්පත යන ඒවායේ නිසි පරිදි සහතික කළ ඡායාස්ථ පිටපත් එවා නොතිබීම.

    ඇ. අසම්පූර්ණ අයදුම්පත්‍ර

    ඈ. අයදුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනට පෙර නොලැබීම.

    ඉහත සඳහන් හේතුන් මත අයදුපත්‍ර ප්‍රතික්ෂේප වන අවස්ථාවකදී අයදුම්කරුවන් විසින් ගෙවා ඇති පරීක්ෂණ ගාස්තු මොනයම් හේතුවක් නිසා හෝ ආපසු ගෙවනු නොලැබේ.

### අයදුම්පත්‍ර එවිය යුතු ආකාරය

*අයදුම්පත්‍ර 2021 ජුනි මස 10* වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ***නියෝජ්‍ය ලේඛකාධිකාරී, විභාග සහ අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ*** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

කරුණාකර ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි "ICT Aptitude Test 2020 / 2021" යනුවෙන් සඳහන් කරන්න.

### යෝග්‍යතා පරීක්ෂණය පැවැත්වෙන දිනය

මෙම යෝග්‍යතා පරීක්ෂණය 2021 ජුනි මස 26 වන සෙනසුරාදා දින පැවැත්වේ. විභාගය පැවැත්වෙන දිනයෙහි කිසියම් වෙනසක් සිදුවුවහොත් ඒ පිළිබඳ දැනුම් දෙනු ලැබේ.

**වැඩිදුර විමසීම් :** අපගේ නිල වෙබ් අඩවිය http://www.rjt.ac.lk ට පිවිසීමෙන් හෝ

නියෝජ්‍ය ලේඛකාධිකාරී, විභාග හා අධ්‍යයන අංශය,
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.
දුරකථන අංක : 025-2266650,
දිගුව : 2142, 2143

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,
විභාග හා ශිෂ්‍ය සේවා අංශය,
වව්නියා මණ්ඩපය, පාර්ක් පාර, වව්නියාව.
දුරකථන අංක : 024-2223317

**වැ.බ. ලේඛකාධිකාරී,**
**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.**
**2021 මැයි මස 20 වන දින**

## SPECIMEN APPLICATION FORM

For Office use only

### UNIVERSITY ADMISSION ACADEMIC YEAR 2020/2021 APTITUDE TEST FOR THE SELECTION OF CANDIDATES FOR BACHELOR OF SCIENCE IN INFORMATION AND COMMUNICATION TECHNOLOGY DEGREE PROGRAMME

1. Name with initials in block letters (Eg: PERERA AC) : ................................................
2. Full Name in block letters : ................................................
3. Address in block letters : ................................................
   (Admission of the Aptitude Test will be sent to this Address)
4. Sex : Male ☐ Female ☐
5. National Identity Card No. :
6. Results of G.C.E. (A/L) Examination 2020 :
   Index No. ☐ District ☐
   Z Score ☐ Telephone Nos. ☐
   E-mail Address ☐
7. Subjects offered & Grade (indicate grade in cage appearing against the respective subject).

| Subject | Grade | Subject | Grade |
|---|---|---|---|
| Higher Mathematics | | Mathematics/Combined Mathematics | |
| Physics | | Chemistry | |
| Accounting | | Business Statistics | |
| Economics | | Business Studies | |
| Biology | | Geography | |
| Logic & Scientific Method | | Sanskrit | |
| Music (Oriental/Carnatic/Western) | | Civil Technology | |
| Mechanical Technology | | Information & Communication Technology | |
| Electrical, Electronic and Information Technology | | | |

8. Results of G.C.E. (O/L) Examination

| Results for : | | Grade | Year |
|---|---|---|---|
| | Mathematics | | |
| | English | | |

9. Have you applied for this course of study for university admission? Yes ☐ No ☐
   (When the application submitted to the U.G.C.)
10. Preferred Examination Centre (Please use "√" symbol)

| | | |
|---|---|---|
| 01 | Mihintale | |
| 02 | Vavuniya | |
| 03 | Jaffna | |
| 04 | Kurunegala | |
| 05 | Kandy | |
| 06 | Colombo | |
| 07 | Badulla | |
| 08 | Matara | |
| 09 | Batticaloa | |

11. Documents to be attached (please indicate the documents attached with the application form by using "√" symbol in the relevant boxes below.
    1. Cash paying-in-slip ☐
    2. Certified copy of G.C.E. (A/L) 2020 Examination results ☐
    3. Certified copy of G.C.E. (O/L) Examination results ☐
    4. Certified copy of National ID Card or Postal ID Card ☐
    5. Affidavit in support of change in names appearing in different documents/ certificates, if any. ☐

I certify that the above particulars submitted by me are true and accurate.

Date:................................ ................................................
Signature of Applicant